# ශ්‍රී ලංකාවේ අභිලේඛනවල භාවිත සූර්යය සංකේත සටහන් පිළිබඳව විමර්ශනයක්

පූජ්‍ය කන්තලේ සුමිත්ත හිමි

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, හෝමාගම
ksumiththa@gmail.com

ඉතා දිගු ඉතිහාසයකට හිමිකම් කියන ශ්‍රී ලංකාවේ අභිලේඛනවල ඉතිහාසය මිට වසර දෙදහස් පන්සියකටත් එහා ගිය එකකි. අභිලේඛන යටතට ගනු ලබන ශිලාලේඛන, ලෝහ ලේඛන, කාසි පුස්කොළ ලේඛන මැටි බඳුන් ආදියේ නිරූපණය කරන රූප සංකේත සටහන් දහස් ගණනක් ශ්‍රී ලංකාවේ හමුවේ. මේවා පැරැණ්නන්ගේ අනන්‍යතාව හගවන සංකේත වන අතර ඇතැම් ඒවා ආගමික හෝ වෙනත් අභිචාරාත්මතක සංකේත වෙනුවෙන් වෙනත් අර්ථවලින් යොදන ලද බවට සාධක අනාවරණය කර ගත හැකිය. එහෙත් මෙම අභිලේඛන පිළිබඳව පර්යෙෂණ කරන උගතුන් අභිලේඛනවලට තරම් අවධානයක් මේ සඳහා යොමුකර නොමැති බව පෙනේ. එබැවින් මෙම අධ්‍යයනයෙන් අභිලේඛනවල නිරූපිත සූර්යය සංකේත හඳුනාගෙන හැකිතාක් එකතුකොට ඉදිරිපත් කිරීමට අදහස් කරනු ලැබේ.

චන්ද්‍ර, සූර්ය, තාරකා ආදී ග්‍රහවස්තු වසර දහස් ගණනක සිට මානවයා විසින් දේවත්වයෙන් සලකන අතර ඒ සඳහා විවිධ ආගමික හා ජනකණ්ඩායම් විසින් විවිධ ඇදහිලි හා පුද පූජා පැවැත්වූ බව පැහැදිලි කරුණකි. ශ්‍රී ලංකාවේ ප්‍රාග්ඓතිහාසික හෝ එම ගණයට අයත් ගුහා චිත්‍රවලත් මැටි බඳුන් ආදියේ මෙන්ම අටවන සියවසින් පසු ලියවුණු අත්තාණි ටැම් ලිපිවලත්, පොළොන්නරු හා මහනුවර යුගවල ලියන ලද ශිලාලිපිවලට අමතරව විශේෂයෙන් තඹ, රිදී හා පුස්කොළ සන්නස්වල මෙම සංකේත කාලය නිරූපණය සඳහාත් භාවිතකොට ඇත. ඒවා නිරූපණය කිරීමේ දී එම අභිලේඛනවල දායකයාගේ හෝ ශිල්පියාගේ අභිමතය පරිදි විවිධවූ රූප අක්ෂර සිය ගණනක් නිර්මාණශිලී ලෙස රූපගත කොට ඇත. මෙම ලේඛන හැකිතාක් සොයාගෙන රූප සටහන් හා ඡායාරූප මගින් ඉදිරිපත් කිරීමට අපේක්ෂිතය.

මෙම සංකේත ඒ ඒ ලේඛනවල කවර අයෙකු විසින් කවර පරමාර්ථයකින් සටහන් කරන ලද දැයි අනාවරණය කිරිමට උත්සහ දැරීම, ඒ ඒ රූපසටහන්වල විවිධ හැඩතලමත කළේ කවර පරමර්ථයෙන් ද යන්න අනාවරණය කරගැනීම, සූර්යය සංකේතයේ අනුක්‍රමික විකාශයන් ගොඩනැඟීමට උත්සහ දැරීම හා එම සංකේත රූප සමකාලීන සමාජය කෙරෙහි අභිලේඛන සමග බද්ධව කවර ආකාරයේ බලපෑමක් ඇති කළේද යන්න නිශ්චය කරගැනීමට ද අපේක්ෂිතය.

ප්‍රමුඛ පද : සූර්යය සංකේතය, අභිලේඛන, අත්තාණි ලේඛන, සන්නස්, ගුහා චිත්‍ර